දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

...වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට,
1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"For a prosperous future"

මගේ අංකය / My No: DSH/DPS/07/DCC/වාර්තා/2024

ඔබේ අංකය / Your No:

දිනය / Date: 2025.07. 01

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2025.06.25</u>**

*2025.06.25* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 07ක් ඇතුලත හෝ ඊට ප්‍රථම මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail.com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-

01. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස

District Secretary - 047 2256235
Additional District Secretary (Admin) - 047 2256232
Additional District Secretary (Land) - 047 2256002
Chief Accountant - 047 2256246
Director (Agriculture) - 047 3628890
Director (Planning) - 047 2256234
Assistant District Secretary - 047 2256945
Administrative Officer - 047 2256285
Office / Fax - 047 2256235, 047 2256247
email: moha.dist.hambantota@gmail.com
Web site: www.hambantota.dist.gov.lk

CamScanner

# හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2025.06.25

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.06.25 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම අභිනවයෙන් පත්වූ පළාත් පාලන ආයතනවල ගරු නාගරාධිපති හා සභාපතිවරුන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගැනීමෙන් අනතුරුව ආයතනවල පවතින නිලධාරී පුරප්පාඩු 2025.06.30 දින වනවිට දැනුම් දෙන ලෙසත් 2025.07.11 දින අතිගරු ජනාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් මීළඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වීමට යෝජිත බැවින් එදිනට සාකච්ඡා කිරීමට ගතයුතු සුවිශේෂී ගැටළු පවතිනම් 2025.07.05 දිනට පෙර ලබා දෙන ලෙසත් සියළුම ආයතන ප්‍රධානීන් වෙත දැනුම් දීමෙන් පසු ගරු සම සභාපතිතුමන්ලා වෙත රැස්වීමේ ඉදිරි කටයුතු කර ගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

අනතුරුව, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ජනතාවට උරුමකර දීමේ පරම චේතනාවෙන් රාජ්‍ය නිලධාරීන් ලෙස අදාල වගකීම් ඉටුකල යුතු බවත් නිලධාරීන් සියළුදෙනා ජනතාවට වගකිව යුතු බවත් පැහැදිළි කරමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට අඛණ්ඩ පැමිණීම අපේක්ෂා කරන බවත් නොවැළැක්විය හැකි හේතුවක් මත පැමිණීමට නොහැකි වේනම්, වගකිවයුතු නිලධාරියෙකු ඒ සඳහා සහභාගි කරවීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී.

පසුගිය රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යායපත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදී. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2025.05.28 දිනැති පසුගිය රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම. | | | | |
| 01. | යටාලතිස්ස පාසල් අධ්‍යාපනයෙන් පසු 6 වසර සඳහා සිසුන් ඇතුළත් කිරීම | 2025.05.28 දින ගනු ලැබූ තීරණය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමෙන් පසු ව්‍යුහ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ යුතු බව සාකච්ඡා කරන ලදී.<br>තවද, 2025.05.28 දින ගන්නා ලද තීරණයට පටහැනිව යටාලතිස්ස සහ ජනාධිපති විද්‍යාලවල විදුහල්පතිවරුන් ක්‍රියාකර ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>දැනට දෙබරවැව ජාතික පාසලේ කඩයිම් ලකුණ ඉක්මවූ සිසුන් ද,අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදෙස් මත කඩයිම් ලකුණින් පහළ සිසුන් 120ක් යටාලතිස්ස ප්‍රාථමික විද්‍යාලයෙන් ඇතුළත්කර ගැනීමටත් ජාතික පාසලේ 6 ශ්‍රේණියේ පංති සංඛ්‍යාව 7 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා වැඩිකර ලුණුගම්වෙහෙර තිස්සමහරාම කොට්ඨාසවල ශිෂ්‍යත්ව සමත් සිසුන් ඇතුලත් කර ගැනීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | විදුහල්පතිවරුන් සම්බන්ධයෙන් පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය අභියෝගකිරීම පිළිබඳව විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට තීරණය කරන ලදී.<br>මෙ පිළිබඳව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කළ යුතු බවට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්<br>ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත.<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට |
| 02. | තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ලේ තොරතුරු ලබා ගැනීම. | CECB ප්‍රධාන කාර්යාලය මඟින් මෙම ගොඩනැගිල්ලට අදල සියළු සැලසුම් ලබාගෙන ඇති බවට දැනුම් දෙන ලදී. | එකී සියළු සැලසුම් තිස්සමහරාම ප්‍රාදේශිය සභාව වෙත ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය, හම්බන්තොට |

විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 03. | කුකුල් ගොවිපලක් සඳහා හම්බන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ අරවනමුල්ල ග්‍රාමනිලධාරී වසමෙන් අක්කර 05ක බිම් කොටසක් ලබා ගැනීම. | මෙම කුකුල් ගොවිපළ සඳහා රෝහන ලියනාරච්චි යන අය විසින් ඉල්ලීමක් සිදුකිරීමෙන් පසු එම ඉල්ලීම සඳහා කොට්ඨාස කළමනාකරු විසින් භෞතික සැලසුම් කමිටු වාර්තාව නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත යොමු කිරීමෙන් අනතුරුව කළාපීය භෞතික සැලසුම් කමිටු නිර්දේශය 2025.01.21 දිනැති ලිපිය මගින් අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) වෙත යොමු කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | බිම් කොටසක් නිදහස්කිරීමට පෙර විධිමත් ලෙස තොරතුරු ඇතුලත් වාර්තාවක් ලබාදීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| 04. | නවයාලවිල ජලාශය සංවර්ධනය කිරීමේ කෙටි කාලීන පියවර | කෙටිකාලීන පියවරක් ලෙස ජලාශයේ රොන්මඩ ඉවත් කිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් කරුවෙකු මගින් සිදුකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ ලබා ගැනීමට හා ක්‍රියාත්මක කරන අවධියේදී අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙසත් ඉල්ලමින් ලිඛිතව දන්වා ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>එසේම, ඉවත් කරන රොන් මඩ මිලදීගැනීම සඳහා මැටි ආශ්‍රිත කර්මාන්තකරුවන් කැමැත්ත ප්‍රකාශ කර ඇති බව හා ඒ අනුව කොන්ත්‍රාත් පිරිවැය අඩුකරගත හැකි බවටත් තවද, අනවසර වගාකරුවන් විසින් ජලාශයට අදාල මායිම්ගල් වෙනස්කර ඇති බවත් කරුණු ඉදිරිපත් විය. | ජලාශයේ මායිම් ගල්වල වෙනස් වීමක් සිදුවීමට පවතින අවධානම හේතුවෙන් ඒ සම්බන්ධව දැන්වීම් පුවරු සවිකිරීම, අනවසර සිද්ධීන් සම්බන්ධව පොලිසිය වෙත පැමිණිලි කිරීම් ආදී කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>2026 වර්ෂයේදී ජලාශය සංවර්ධන කටයුතු සඳහා ඊට අදාල ප්‍රතිපාදන වෙන්කර ගැනීමේ කාර්යයන් කඩිනමින් සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණ), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ප්‍රාදේශිය ලේකම්, බෙලිඅත්ත |
| 05. | සූරියවැව වීරියගම ප්‍රදේශයේ නිදන් ලබා ගැනීමේ අරමුණින් කැණීම් සිදුකිරීම. | ඉදිරිපත් වී ඇති තොරතුරු අනුව, බලපත්‍රලාභියා විසින් අනවසර කටයුතු සම්බන්ධව වගකිවයුතු බවට සාකච්ඡා විය. | මෙකී ඉඩමෙහි බලපත්‍රය අවලංගු කිරීමට උපදෙස් දෙන ලදි. | නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| 06. | රන්මිහිතැන්න ටෙලි සිනමා ගම්මානය පිවිසෙන මාර්ගය නඩත්තු කිරීම | වාරි මාර්ග දෙපාර්තමේන්තුවට අයත් මාර්ගයක් බවට කරුණු ඉදිරිපත් වූ අතර එකී දෙපාර්තමේන්තුව විසින් මාර්ග කාපට් කිරීම සිදු නොකරන බවත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට එම මාර්ගය පැවරිය නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | ඒ අනුව, මාර්ගයේ නඩත්තු කටයුතු වර්ෂයේ ප්‍රතිපාදන මගින් සිදුකරන ලෙස තිස්සමහරාම ප්‍රාදේශිය සභාවට සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ<br>ප්‍රාදේශිය ලේකම්, තිස්සමහාරාම<br><br>ලේකම් ප්‍රාදේශිය සභාව තිස්සමහාරීම |
| 07. | උද්ධකන්දර ග්‍රාම නිලධාරී වසමේ කුණුවල අසල අනීතික ලෙස බොරළු කපා ප්‍රවාහනය කිරීම. | මෙකී ස්ථානයෙන් පස් කැපීමට අවසර ලබාදී ඇති ප්‍රමාණය පස් කියුබ 260 වුවත් පස් කියුබ 1500 ක් පමණ කපා ඇති බවට කොන්ත්‍රාත් කරු විසින් ප්‍රකාශ කර ඇති බවට කරුණු ඉදිරිපත් විය. | කපන ලද වැඩිපුර පස් ප්‍රමාණයට අදාලව රාජ්‍යභාරය අයකර ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. තවද බලපත්‍රය අවලංගු කරන ලෙසත් මෙම ඉල්ලුම්කරුගේ තැන්පතුව සම්බන්ධව හා අනීතික බොරළු ඉවත් කිරීම | ප්‍රාදේශිය ලේකම්, තිස්සමහරාම.<br><br>කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය.<br><br>දිසා වන නිලධාරී, හම්බන්තොට |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගන්නා ලෙසත් තීරණය විය. | |
| 08 | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිත සුළං සහ සූර්යබලශක්ති ව්‍යාපෘති. | 2025.06.12 වන දින මේ සඳහා වෙනම සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිදී සුළං විදුලිබලාගාර ඉදිකිරීම සඳහා ඉල්ලුම් කර ඇති ඇතැම් ස්ථාන නාගරික ප්‍රදේශයට අයත්වන බැවින් විකල්ප සුදුසු ස්ථාන හඳුනාගන්නා ලෙසට අදාල සමාගමට දැනුවත් කර ඇති බවට පැහැදිලි කරන ලදි. | අදාල ව්‍යාපෘති කාලය තුළ කිසිදු ගැටලුවක් ඇති නොවන පරිදි සියළු කාරණා සලකා බලා භූමිය තෝරාගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්,<br>නේවාසික ව්‍යාපාර කළමනාකරු, මහවැලි<br>අදාල ප්‍රාදේශිය ලේකම් වරුන්<br>නාගරික කොමසාරිස්<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ,ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>සහකාර අධ්‍යක්ෂ, වනජීවි<br>දිසා වන නිලධාරී |
| **අනතුරුව 2025.06.25 දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදි. ඒවා පහත පරිදි වේ.** | | | | |
| 09. | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම | 2025 වර්ෂය සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන දිස්ත්‍රික්කය සඳහා රු.මි. 80 ක් සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 12 සඳහා අනුමත වී ඇති ව්‍යාපෘති 49 ට අදාල ඇස්තමේන්තු සෑදීම ප්‍රමාදවූ බවත් ගියවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී දුන් උපදෙස් පරිදි 2025.06.04 දින පවත්වනු ලැබූ ව්‍යාපෘතිවල ඇස්තමේන්තු සකස්කිරීමට අදාල රැස්වීමේදී ගනු ලැබූ තීරණ අනුව, දැනට කටයුතු කරන බවත් ඒ අනුව ඇස්තමේන්තු 22ක් සකස්කර අවසන් බවත් ඉතිරි ව්‍යාපෘති වලට අදාල ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>තවද, ව්‍යාපෘති 2 ක වැඩ ආරම්භ කර ඇති බවත් දැනුම් දෙන ලදි.<br>මෙකී සියළුම ව්‍යාපෘති රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව ක්‍රියාත්මක කර 2025 නොවැම්බර් 15 දිනට පෙර වැඩ අවසන් කර බිල්පත් ගෙවිය යුතු බවත් සංශෝධන කාලය අවසන් වී ඇති බැවින් කඩිනමින් ව්‍යාපෘති වැඩ අවසන් කරන ලෙස දැනුම් දෙන ලදි. | කඩිනමින් වැඩකටයුතු ආරම්භ කරන ලෙසත් නියමිත දිනට අවසන් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන)<br>දිස්ත්‍රික් ඉංජිනේරු<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | • ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන<br>ප්‍රවාහන මහාමාර්ග , වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යංශය මගින් දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 කට අදාලව ක්‍රියාත්මක කිරීම සඳහා ග්‍රාමීය මාර්ග රු.මි. 79.2 ක් ව්‍යාපෘති 25 ක් සඳහා අනුමත කර ඇත. ඉන් ව්‍යාපෘති 2ක් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර ඉතිරි ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී. මෙකී සියළුම ව්‍යාපෘති රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව ක්‍රියාත්මක කර 2025 දෙසැම්බර් 15 දිනට පෙර වැඩ අවසන් කර බිල්පත් ගෙවිය යුතු බවත් කඩිනමින් ව්‍යාපෘති වැඩ අවසන් කරන ලෙස දැනුම් දෙන ලදි.<br>එසේම, මෙකී අමාත්‍යාංශයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කිරීම සඳහා තංගල්ල සහ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අදාලව ව්‍යාපෘති 3 ක් සඳහා රු.මි. 99.5 ක් ලෙස අනුමැතිය ලැබී ඇත.<br>තවද, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කර තිබූ රු.මි. 49.5 ක ව්‍යාපෘතියක් වෙනුවට ප්‍රමුඛතාවය මත රු.මි. 60 නව ව්‍යාපෘතියක් සංශෝධනයකින් අනුමත කර ඇත.<br>• **දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් සංවර්ධන යෝජනා.**<br>ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිවරුන්ගේ අනුමැතියෙන් අමාත්‍යාංශය වෙත යොමු කරමින් පවතින බවත් දිස්ත්‍රික්කයේ සෑම ග්‍රාම නිලාධාරී වසමකටම අදාල ග්‍රාම සංවර්ධන සැලසුම්සකස් කරමින් පවතින බවත් පැහැදිලි කරන ලදි. | | |
| 10. | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධව දැනුවත් කිරීම. | 2025 වර්ෂයට අදාලව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම තුළ හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ<br>• **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)**<br>• **උපමාන පාදක ප්‍රදාන (CBG)**<br>වශයෙන් ව්‍යාපෘති 602 ගටනේ එකී මුදල් දකුණු පළාත් සභාවේ | 2025 නොවැම්බර් මාසය වන විට මෙකී ව්‍යාපෘති නිමකළයුතු බවත් ලබා දෙන ලද ප්‍රතිපාදන නැවත අමාත්‍යාංශ වෙත යොමු නොවන පරිදි කඩිනමින් අවශ්‍යකටයුතු අදාල කාලසීමාවන් තුළ සිදු කරන ලෙසට උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ඒ ඒ විෂයන්ට අදාලව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මඟින් ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදි.<br><br>එසේම, **2025.05.30** දිනට<br><br>- **මූල්‍ය ප්‍රගතිය**<br>අනුමත මුදල රු.මි. 1808.59<br>වියදම රු.මි. 49.82<br><br>- **භෞතික ප්‍රගතිය**<br>වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව - 21<br>ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව - 486<br>වැඩ ආරම්භ කිරීමට නියමිතව ඇති ව්‍යාපෘති සංඛ්‍යාව - 95<br><br>• **ග්‍රාමීය පාලම් වැඩසටහන සඳහා - රු.මි.8.40**<br>මෙකී ග්‍රාමීය පාලම් ව්‍යාපෘති ඕකෙවෙල, බෙලිඅත්ත, වලස්මුල්ල, වීරකැටිය සහ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මුල්කරගනිමින් ක්‍රියාත්මක කෙරේ.<br><br>• **"Clean Sri Lanka" (අයවැය ප්‍රතිපාදන) වැඩසටහන සඳහා - රු.මි. 25**<br>**"සියළුම දරුවන්ට සමාන ඉගනුම් අවස්ථා ලබා දීම"** අරමුණ කරගනිමින්<br>- පාසල්වල ආරක්ෂිත සහ ආකර්ශනිය ඉගෙනුම් පරිසරයක් සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ/ ඉදිකිරීම සඳහා ව්‍යාපෘති 4 ක් (රු.මි.8)<br>තංගල්ල, තිස්සමහරාම, ඕකෙවෙල සහ වලස්මුල්ල ප්‍රාදේශිය ලේකම් කොටයාස මුල්කරගනිමින් ක්‍රියාත්මක බවත්,<br>- සිසුන්ගේ සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති 7 ක් (රු.මි.17)<br>බෙලිඅත්ත, තිස්සමහරාම, වීරකැටිය සහ සූරියවැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසවල පාසල් මුල්කරගනිමින් ක්‍රියාත්මක බවත් විස්තර කරන ලදි. | | පළාත)<br><br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 11. | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පැහැදිලි කිරීම. | ඩෙංගු හා මී උණ රෝගය පැතිරීමේ වර්ධනයක් නොමැති බවත් ප්‍රාදේශිය සභා මඟින් සිදුකරනු ලබන කසල ඉවත් කිරීමේ කටයුතු අඛණ්ඩව | පැවැත්වීමට නියමිත පරිදි රැස්වීම පවත්වා එකී වාර්තා ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සිදුකිරීම තුළින් ඩෙංගු රෝගය බෝවීමේ අවධානම පාලනය කිරීමට හැකියාව ලැබෙන බවත් කිට විද්‍යාත්මක සමීක්ෂණ සිදුකරමින් මර්ධන කටයුතු සිදුකරන බව පැහැදිළි කරන ලදි. | | |
| | | එසේම, ජුනි මාසය පෝෂණ මාසය ලෙස නම් කර ඇති බව හා "එළවළු පළතුරු ගුණ දෙයි නිරතුරු" අරමුණ යටතේ<br>• අතේ ඇඟිලි 5 උපමා කරගනිමින් එළවළු අනුභවය එනම්, එළවළු - 2 පලතුරු - 2 පලා වර්ග - 1 ලෙස අහාර වේලකට එක්කර ගැනීම.<br>• පලතුරු කැබලි කපා අනුභව කිරීම.<br>• අලුත් එළවළු ආහාරයට එකතුකර ගැනීම.<br>• තෙල්, ලුණු, සහ සීනි ආහාර පරිභෝජනය අඩු කිරීම.<br>යනාදී පුරුදු ජීවිතයට එකතු කරගැනීමේ වැදගත්බව පැහැදිලි කරමින් ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය ඉහල නැංවීම සඳහා සියළු නිලධාරීන්ගේ සහයෝගය අපේක්ෂා කරන ලදි. | සකස් කර ඇති පෝෂණ ආහාර වේල සමාජගත කලයුතු බව දැනුම් දෙන ලදි. | |
| | | තවද, මානසික සෞඛ්‍ය ඒකකය මගින් සියදිවි නසාගැනීමට උත්සාහ කරන්නන් එම තත්ත්වයන්ගෙන් මුදවා ගැනීමට සිදුකරන වැඩසටහන් යටතේ ඉහල ප්‍රගතියක් පවතින බවත් එහි ප්‍රතිඵලයක් ලෙස සියදිවි නසාගැනීම් පසු ගිය වර්ෂයට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කරන බවත් පැහැදිලි කරන ලදි. | | |
| | | එසේම, ජලභීතිකා රෝග පාලන ඒකකය මගින් 2025 වර්ෂයේ මැයි මස අවසාන වන විට සුනඛයින් 20,617 දෙනෙකුට එන්නත් ලබා දී ඇති අතර මෙහිදී සුනඛ සපාකෑමට ලක්ව තුවාල හේතුවෙන් එන්නත්කරුවන් වෛද්‍ය නිවාඩු ලබා ගෙන ඇති බව දැනුම් දෙන ලදි. | සුනඛයින් සඳහා මුඛ ආවරණ යොදා එන්නත් කරණ කිරීම පමණක් සිදු කරන ලෙස උපදෙස් දෙන ලදි. | |
| | | එසේම, රාත්‍රී සේවා සපයන රෝහල් සඳහා පොලිස් ආරක්ෂාව අවශ්‍ය බවත් දැනුම් දෙන ලද අතර කාර්ය මණ්ඩල අවශ්‍යතාවය 2014 වර්ෂයෙන් පසු සංශෝධනයක් සිදුව නොමැති බවත් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකලයුතු අත්‍යාවශ්‍ය රෝහල් පවතින බවත් වැඩිදුරටත් | පවතින ගැටළු සඳහන් කර වාර්තා කරන ලෙස දැනුම් දෙන ලදි.<br>පොලිස් ආරක්ෂාව අවශ්‍ය රෝහල් වල විස්තර ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | පැහැදිලි කරන ලදි.<br><br>තවද, තංගල්ල මූලික රෝහලේ භාවිතයට ගත නොහැකි ගොඩනැගිල්ලක් පවතින බවටද කරුණු ඉදිරිපත් විය. දකුණු පළාත් සභා ප්‍රධාන අමාත්‍යාංශය මඟින් දිස්ත්‍රික්කය තුළ දැනටමත් ව්‍යාපෘති 7 ක් සිදුකිරීමට සැලසුම් කර ඇති බවත් තංගල්ල රෝහල් ගොඩනැගිල්ල නව යෝජනාවක් බැවින් ඒ සඳහා ප්‍රතිපාදන වෙනම සොයා ගැනීමට ඇස්තමේන්තුවක් අවශ්‍ය බවත් දන්වන ලදි.<br><br>දිස්ත්‍රික්කයේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම සඳහා ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකය මඟින් දිස්ත්‍රික්කය පුරා විවිධ වැඩසටහන් සිදු කරන බවත් දිස්ත්‍රික් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ඒකකයේ සියළු කටයුතු සඳහා එක් වාහනයක් පමණක් පවතින බවත් එය කිසිසේත් ප්‍රමාණවත් නොවන බවත් පැහැදිලි කරන ලදි. | මෙම ප්‍රතිසංස්කරණය කලයුතු අත්‍යාවශ්‍ය කටයුතු ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි.<br><br>කඩිනමින් ඇස්තමේන්තුව ලබා දෙන ලෙස දන්වන ලදි. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.<br>රෝහල් අධ්‍යක්ෂ, තංගල්ල.<br><br>දිස්ත්‍රික් ඉංජිනේරු, ගොඩනැගිලි.<br><br>ආයුර්වේද වෛද්‍ය |
| 12. | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම | සංවිධාන අපරාධ දිස්ත්‍රික්කය තුළ පාලනය කර ඇති බව හා වැටලීම් සිදු කර මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට පියවර සක්‍රියව ක්‍රියාත්මක කරමින් බවතින බව සහ ලෝක මත් ද්‍රව්‍ය විරෝධී දිනය මුල් කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක වන බවත් මහජන ආරක්ෂක කමිටු 583 ක් පිහිටුවා ඇති බවත් පැහැදිලි කරන ලදි.<br>එසේම, දිස්ත්‍රික්කය තුළ පුනරුත්තාපන මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අවශ්‍යතාවය සහ එහි පසුබිම වැඩිදුරටත් සාකච්ඡා විය. | මහජන ආරක්ෂක කමිටු පිහිටුවීමේදී පෙර වර්ෂයන්වල සේවය කරන ලද නිලධාරීන් පත්කර නොගන්නා ලෙස මඟපෙන්වන ලදි.<br><br>දිස්ත්‍රික්කය තුළ මේ සඳහා සුදුසු ස්ථාන කිහිපයක් හඳුනාගෙන එකී ස්ථාන අධ්‍යයනය කර නිරීක්ෂණ ලබා දීමට මෙකී විෂය තුළ සේවයේ නියුතු නිලධාරීන් සඳහා ආරාධනාකර සේවය ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |
| 13 | **ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 13.1 | **ප්‍රාදේශිය ලේකම්, ලුණුගම්වෙහෙර** | | | |
| 13.1.1 | පහල මත්තල, අඟුණුකොලවැව, මහඅළුත්ගම්ආර වසම්වල ගොවි සංවිධාන වලින් වන සංරක්ෂණ ඉඩම්වල ලදු කැලෑ කපා හේන් වගා කිරීම සඳහා අවසර | ජූලි මස සිට හේන් ගොවිතැන් ආරම්භ වන බැවින් මෙම වසම් වල පමණක් නොව දිස්ත්‍රික්කයේ හේන් ගොවිතැන් කිරීම සඳහා ගොවීන් යොමු වන හෙයින් පොදු තීරණයකට පැමිණිය යුතු බව සාකච්ඡා විය.<br><br>සූරියවැව ආයෝජන මණ්ඩලයට අයත් අක්කර 900 ක පමණ භූමිය | 2025 මාර්තු 26 වන දිනැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වාර්තාවේ අනු අංක 8.2 ට අදාල තීරණය පරිදි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදි.<br><br>ආයෝජන මණ්ඩලයට අයත් භූමිය තුළ | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්), |



චිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | ඉල්ලීම. | මෙතෙක් කිසිදු සංවර්ධනයක් සිදුකර නොමැති හෙයින් ජේත් ගොවිතැන් කිරීම සඳහා අවසර ලබා දිය හැකිදැයි කරුණු සාකච්ඡා විය. | අවසරයකින් තොරව කිසිදු කටයුත්තක් සිදුකල නොහැකි හෙයින් ඒ සඳහා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයෙන් අවසර ලබාගන්නා ලෙස තීරණය විය. | ප්‍රාදේශිය ලේකම්, සූරියවැව |
| 13.1.2 | ලුණුගම්වෙහෙර ජලාශය ආශ්‍රිතව ධීවර තොටුපල නවීකරණය සහ ධීවර ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා සංචාරක පුරවර ගොඩනැගීම. | සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත පවතින ධීවර තොටුපල තුනම එකම ස්ථානයක සංවර්ධනය කරීම ඇතුලත්ව තොටුපල නවීකරණය ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු අනුමැතිය ලබාගත යුතු බවට කරුණු ඉදිරිපත් වූ අතර ධීවරයිනගේ කැමත්ත මේ සඳහා පවතින බවත් වනජීවී මුරපොළක අවශ්‍යතාවය ද පැහැදිළි කරන ලදි. | ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර වනජීවී මුරපොළක් ස්ථානගත කිරීමේ ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, ලුණුගම්වෙහෙර<br><br>සහකාර අධ්‍යක්ෂ (වනජීවී) දකුණ |
| 13.1.3 | දියබැදිය - අභයපුර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම. | මෙම මාර්ගයේ මීටර් 800 ක් කාපට් කර ඇති බවත් ඉතිරි කොටස සංවර්ධනය කිරීම කලයුතු බවත් මෙය තිස්ස හා ලුණුගම්වෙහෙර කොටස් දෙකටම අයත් බවත් ප්‍රකාශ කරන ලදි. | මාර්ගයේ ඉතිරි කොටස සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට තීරණය විය. | දිස්ත්‍රික් ඉංජිනේරු, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය.<br><br>ප්‍රාදේශිය ලේකම්, ලුණුගම්වෙහෙර |
| **13.2** | **ප්‍රාදේශිය ලේකම්, හම්බන්තොට** | | | |
| 13.2.1 | ගොන්නොරුව හරහා තම්මැන්නාව දක්වා ධාවනය වූ බස් රථය නවතා දැමීම සම්බන්ධ ගැටළුව. | ධාවනය කළ හැකි බස් රථ හා කාර්මිකයින්, රියදුරන් හා කොන්දොස්තර යන සේවකයින්ගේ අඩුවක් පවතින බවත් නැවත මෙම සේවාව ආරම්භ කිරීමේ අපහසුතාවයක් පවතින බවත් සාකච්ඡා විය.<br>තවද, බොහෝ මාර්ගවල ඩිපෝ මහින් ධාවනය කල යුතු සියලුම ගමන් වාර ක්‍රියාත්මක නොවන බවට කරුණු ඉදිරිපත් විය. | 2025.07.11 වන දින දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීමට තීරණය විය.<br><br>තවද,පළාත් කළමනාකරු දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම සඳහා කැඳවීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්<br><br>ඩිපෝ කළමණාකරු, අම්බලන්තොට |
| 13.2.2 | මාර්ග සඳහා අත්පත් කර ගැනීම හේතුවෙන් ගොන්නොරුව පාසලේ වහලයේ නඩත්තු කටයුතු සිදු නොකිරීම. | මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම අත්පත්කර ගැනීමේදී පාසල් භූමියේ කොටසක් ඉවත් වන නිසා ඉතිරි කොටසේ පාසල පවත්වාගෙන යාම ගැටළුවක් බැවින් පාසල පවත්වාගෙන යාම අනතුරුදායක වියහැකි බවත් ඒ සඳහා පාසල ඉදිරිපිට පවතින ( පාසලට වෙන්කර ඇති) අක්කර 05ක භූමිය මේ සඳහා යොදාගතහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. තවද එම භූමිය තුළ පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවශ්‍ය මුදල් අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොපවතින | මීට අදාලව ඇස්තමේන්තුවක් සකස්කර කඩිනමින් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය.<br><br>ප්‍රාදේශිය ලේකම්, හම්බන්තොට<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට |

ඩිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | බවටත් කරුණු ඉදිරිපත් විය. එමුත් පාසල් භූමියෙන් කොටසක් මාර්ග සංවර්ධන අධිකාරිය අත්පත් කරගන්නා නිසා අවශ්‍ය මුදල මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ලබා දිය යුතු බවට යෝජනා විය. | | |
| 13.3 | ප්‍රාදේශිය ලේකම්, වීරකැටිය | | | |
| 13.3.1 | කොට්ඨාසය තුළ ඇති අනතුරුදායක ගස් ඉවත් කිරීම, දැව සංස්ථාව මඟින් ප්‍රමාද වීම. | කොට්ඨාසට තුළ අනතුරුදායක ලෙස පවතින ගස් ලේඛනයක් දැවසංස්ථාවට යොමු කලත් එම ආයතනය නිසි පරිදි එම කටයුතු සිදු නොකරන බවට චෝදනා ඉදිරිපත් විය. තයද, දැවමය වටිනාකම් සහිත ගස් පමණක් ඉවත් කිරීම කෙරෙහි ඔවුන් වැඩි කැමැත්තක් දක්වන බවටද කරුණු ඉදිරිපත් විය.<br>එසේම, පවතින නීමය තත්ත්වය යටතේ හානිදායක ගස් ඉවත් කිරීම සඳහා වෙනත් ආයතන වලට කඩිනමින් කටයුතු කිරීමේ අපහසුතා පවතින බවටද කරුණු ඉදිරිපත් විය.<br>ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැතවී වීමත් අධික ලෙස ඉල්ලීම් ලැබී තිබීමත් නිසා දැව ඉවත් කිරීමේ කටයුතු ප්‍රමාධ වුවත් උපරිම කැබවීමකින් දැව ඉවත් කිරීමට කටයුතු කරන බවත් දැව සංස්ථාව මඟින් ප්‍රකාශ විය. දැනටමත් ඇල මාර්ග ආශ්‍රිතව අවහිරව පවතින දැව ඉවත් කිරීම අත්‍යාවශ්‍ය බවත් ආපදා තත්ත්වයන් හඳුනාගෙන ඇති ස්ථාන සම්බන්ධව දැනුවත් කලත් යහපත් ප්‍රතිචාර දැව සංසංථාවෙන් නොලැබෙන බව ප්‍රකාශ විය. | මෙ සම්බන්ධව අමාත්‍යාංශය වෙත දැනුම් දීමට තීරණය විය.<br>එමෙන්ම, දැව සංස්ථාව මීට වඩා අවධානයෙන් කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදි.<br>හැකියාවක් පවතිනම් අනතුරුදායක ගස් ඉවත් කිරීම අදාල ප්‍රාදේශිය සභාව මඟින් සිදුකරන ලෙස දැනුම් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්), සියළුම ප්‍රාදේශිය ගරු සභාපතිවරුන් |
| 14 | 2025 වර්ෂයේ වාරිමාර්ග ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාලව CResMPA ව්‍යාපෘතිය යටතේ වැඩ යෝජනා | මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිරි අදියර තුළ වාරි ජල කළමනාකරණය කිරීමට අවශ්‍ය මෙවලම් අලුත්වැඩියා කිරීමට අදාලව තිස්සමහරාම සහ හම්බන්තොට යන ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කොට්ඨාසයන් තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත අත්‍යාවශ්‍ය කර්මාන්ත 16 ක් සහිත ලේඛනය සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාගත යුතු බවට කරුණු ඉදිරිපත් විය. | සතියක් ඇතුළත නිරීක්ෂණය කර තීරණ ලබා දීමට එකඟ විය. | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ |



(අත්සන) ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 15 | 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සුළුවාරි මාර්ග ව්‍යාපෘති යෝජනා 10 ඉදිරිපත් කර ඇත. | 2025 වර්ෂයට අදාලව ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති යෝජනා 10 ක් සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි<br>එමෙන්ම, වෙළදපොලේ පොහොර හිඟයක් පවතින අවස්ථාවල ගොවිජන සේවා මධ්‍යස්ථාන තොග රැස් කර නොගන්නා බවට චෝදනා එල්ලවන බවත් ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පොහොර ලබා ගැනීම ගොවිජන සේවා කමිටු අරමුදලින් සිදු කරන බවත් එමකමිටුවල ප්‍රමාණවත් මුදල් නොමැති බැවි පොහොර ලබාගැනීමේ හැකියාවක් නොමැති බවත් ප්‍රකාශ කරන ලදි.එබැවින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට පොහොර ලබාගැනීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති බැවින් එම මධ්‍යස්ථානවල පොහොර හිඟයක් ඇතිවීමේ වගකීම භාරගත නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | සති දෙකක් ඇතුළත නිරීක්ෂණය කර තීරණ ලබා දීමට එකඟ විය. | දිස්ත්‍රික් ලේකම්<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, හම්බන්තොට<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්, හම්බන්තොට |
| 16 | සංවර්ධන ව්‍යාපෘති සඳහා පස් ලබා ගැනීම | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පස් ලබා ගැනීමේදී පවතින ක්‍රමවේදය යටතේ ගතවන කාලය අධික බැවින් එවිට ව්‍යාපෘති කාලය ඉක්මවීමක් සිදුවන හෙයින් මේ සඳහා අවශ්‍ය පස් ලබා ගැනීමට කඩිනම් ක්‍රමවේදයක් අවශ්‍ය බව සාකච්ඡා විය. | පස් ලබා ගන්නා ස්ථාන අයත් භූමි කොටස්හි හිමිකාරිත්වය අයත් ආයතන සඳහා පස් ලබා ගැනීමේ නියමිත ක්‍රමවේදයටම අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් එකී ක්‍රමවේදය තුළ සේවය සපයන ආයතන අද දින මෙම රැස්වීමෙන් අනතුරුව රැස්ව එකී කාර්ය කඩිනමින් කිරීමට අවශ්‍ය කරුණු සාකච්ඡා කරගන්නා ලෙස දැනුම් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්),<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් |
| 17 | සාකච්චාකරන ලද වෙනත් කරුණු | | | |
| 17.1 | තිස්සමහරාම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ සඳගිරිගම හරහා කැරම්මුල්ල ප්‍රදේශයට විදුලි බලය ලබා ගැනීම | මෙම ප්‍රදේශයට විදුලි බලය ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් විශාල ගොවි ජනතාවක් හා පදිංචිකරුවන් පිරිසක් සිටින අතර ප්‍රදේශයේ කුඩා හෝටල් සංකීර්ණ කිහිපයක් ඇති බවත් මෙම ප්‍රදේශයට විදේශ සංචාරකයින් පැමිනෙණ බවත් ඒ සඳහාද විදුලි බලය ලබා ගැනීමේ අවශ්‍යතාවය පවතින බවත් සාකච්ඡා විය. | මෙකී ප්‍රදේශයේ ස්ථානීය පරික්ෂාවක් සිදුකර විදුලි බලය ලබා දීමේ සැබෑ අවශ්‍යතාවය හා විදුලි බලය ඉල්ලුම් කරන ප්‍රතිලාභීන්ගේ ඉඩම් වල අයිතිය හා පදිංචි ස්වාභාවය ආදී කරුණු ඇතුලත් සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය ලේකම්, තිස්සමහරාම.<br>ප්‍රධාන විදුලි ඉංජිනේරු, හම්බන්තොට |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | එසේම, ප්‍රදේශයේ පවතින හෝටලයක් සඳහා විදුලි අවශ්‍යතාවය සඳහා ඉල්ලුම් කිරීමෙන් අනතුරුව රු.මි.24.5 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කල බවත් මේ වන තෙක් එම මුදල් ගෙවා නොමැති බවත් දන්වන ලදි. තවද ලංකා විදුලිබල මණ්ඩලයේ පවතින ක්‍රමවේදය මතඑක් පාරිභෝගිකයෙකු වෙනුවෙන් රු. ලක්ෂ 4ක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් දායකත්වය දක්වන බැවින් ප්‍රතිලාභී 25 දෙනාම ඉල්ලුම් කලත් රු.මි. 10ක් ලංකා විදුලිබල මණ්ඩලයට දැරිය හැකි අතර ඉතිරි ප්‍රතිපාදන ලැබිය යුතු බවත් දන්වන ලදි. එමෙන්ම, මෙම විදුලිය ඉල්ලුම් කරනු ලබන පාරිභෝගිකයින්ගේ පදිංචිය නීත්‍යානුකූලදැයි තහවුරුකරගතයුතු බවත් අවධානයට ලක් විය. | | |
| 17.2 | දිස්ත්‍රික්කය තුළ කාන්තා හා ළමා රැකවරණ මධ්‍යස්ථානයක් පිහිටුවීමේ අවශ්‍යතාවය. | වාර්තාවන විවිධ හේතූන් මත අනාරක්ෂිත භාවයට පත් දරුවන් හා කාන්තාවන් නීතිමය කටයුතු සිදුවන තෙක් තාවකාලිකව රඳවා තැබීමට ස්ථානයක් දිස්ත්‍රික්කය තුළ නොමැති වීම හේතුවෙන් හා අපහසුතාවයට පත්වන බවත් වින්දිතයා හා වූදිතයා එකම නිවසේ සිටීම මත රාජකාරී කටයුතු ද සිදුකිරීම අතිශය අර්බුධකාරී අතර ඒ හේතුවෙන්ම, වින්දිතයා නැවත. නැවත අසරණ භාවයට පත්වීමට පවතින ඉඩකඩ වැඩි බවත් පැහැදිලි කරණ ලදි.<br><br>එසේම, මේ සඳහා දෙබරවැව ප්‍රදේශයේ පවතින පෞද්ගලික ගොඩනැගිල්ලක් හම්බන්තොට කාන්තා මහා සංගමය හරහා ලබා දීමට එකඟතාවය පළකර ඇති බවට වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය. | මෙකී ගොඩනැගිල්ලේ සහ භූමියේ අයිතිය කා සතුද යන්න හා පවතින පහසුකම් හා කෙසේ පැවරීමට එකඟතාවයක් පවතිනවාද යන්න සහ මෙම රැකවරණ මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ ක්‍රමවේදය හා ඔවුන් සඳහා සේවා පහසුකම් සැපයීමේදී මෙම ගොඩනැගල්ල භාවිතා කළහොත් පවතින සබ්‍යතාව යනාදී කරුණු ඇතුලත් පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරී |
| 17.3 | හම්බන්තොට නගරය මුලික කර ගනිමින් සංචාරක ආකර්ශණය වැඩි කර ගැනිම සඳහා ව්‍යාපෘතියක් හඳුන්වා දීම. | හම්බන්තොට වරායෙහි ප්‍රධාන දිය කඩනයට ඔබ්බෙන් ඉතාමත් වැදගත් Surfing Point එකක් පවතින බව හා එකී ස්ථාන අධ්‍යයනය කර Hambantota Surf Point Proposal නමින් ව්‍යාපෘති වාර්තාවක් ලබා දී ඇති බවත් එකී ව්‍යාපෘතියට ඇතුලත් කරුණු දිර්ඝ ලෙස සාකච්ඡාවට බඳුන් විය. | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සකස්කර ඇති සැලස්මද නිරීක්ෂණය කර අදාල අංශ එක්වී විධිමත් අධ්‍යයනයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | වරාය කළමනාකරු, හම්බන්තොට. |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ඒ අනුව, "Tower Hill Development Project" ලෙස නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සැලස්මක් සකස්කර ඇති බවත් මෙකී ප්‍රදේශ ආශ්‍රිතව කටයුතු කිරීමේදී හම්බන්තොට වෙළඳ සංගමයෙහි සහයෝගය ලබා ගැනීම මඟින් කාර්ය පහසුවන බවට ද වෙරළ භාවිතා කිරීමේදී හෝ සීමාව වෙන් කිරීම සඳහා අවසර ගැනීමට හෝ වෙන්කර හඳුනා ගැනීමට ක්‍රමවේදයක් නොමැති හෙයින් දැන්වීම් පුවරුවක් සකස් කිරීම සුදුසු බවට ද වැඩිදුරටත් කරුණු ඉදිරිපත් විය. | වෙළඳ සංගමයේ සහයෝගය අවශ්‍ය අවස්ථාවල ලබාගන්නා ලෙසත් දැන්වීම් පුවරුවක් සවිකිරීම සුදුසු බවත් දැනුම් දෙන ලදි. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාගරික සංවර්ධන අධිකාරිය. |
| 17.4 | වලස්මුල්ල පල්ලෙකන්ද පාර යාය පාලම වැඩ අවසන් කිරීම. | පාලම ඉදිකිරීම වෙනුවෙන් ප්‍රවාහනය කර ඇති අමුද්‍රව්‍ය ඒ ආසන්නව නිවසක තව දුරටත් ගොඩගසා ඇති අතර එම පුද්ගලයාට එය බාධාවක් වී ඇති බව දැනුම් දී ඇති බවත් මෙම පාලමේ වැඩ කටයුතු නතර කිරීම හේතුවෙන් ගැටළු රාශියක් උද්ගතවී ඇති බවත් පාලම කඩිනමින් නිම කිරීම කළ යුතු බවත් ඒසඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය වන බවත් දන්වන ලදී. | ප්‍රමුඛතාවය ලබාදෙමින් මෙම පාලමේ වැඩ අවසන් කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්,<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |
| 17.5 | හම්බන්තොට දිස්ත්‍රික් වන අලි කළමනාකරණ කලාපය තුළ ඇති කළු ගල් කර්මාන්තය පිළිබඳ ගැටළු ඉදිරිපත් කිරීම. | වන අලි කළමනාකරණ රක්ෂිතය තුල පිහිටා ඇති කර්මාන්ත 5න් තව දුරටත් ගිවිසුම් කාලය පවතින ව්‍යාපෘති 2 ක් ගිවිසුම් කාලය අවසන් වූ පසු නතර කිරීම සුදුසු බවට යෝජනා විය.එහෙත් මෙම කර්මාන්ත සම්බන්ධව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල පැවති රැස්වීමකදී ලබා දුන් උපදෙස් පරිදි පුපුරණ ද්‍රව්‍ය පාලන අංශය,මධ්‍යම පරිසර අධිකාරිය,භූවිද්‍යා හා පතල් කාර්යංශය,ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්,වනජීවිදෙපාර්තමේන්තුව යන ආයතන වල නිලධාරින් ගෙන් සමන්විත කමිටුවක් මඟින් ඒකාබද්ධ පරීක්ෂණයක් සිදු කරන ලෙස ලබා දුන් උපදෙස් පරිදි කරන ලද ඒකාබද්ධ පරීක්ෂණය අනුව වනජීවීන් කළමනාකරණය කර ගනිමින් එම කටයුතු වලට බාධාවක් නොවන පරිදි මෙම කර්මාන්ත | එම ඒකාබද්ධ වාර්තාව අධ්‍යයනය කළ යුතු බවට තීරණය විය. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී)<br><br>සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය<br><br>කැනීම් ඉංජිනේරු භූවිද්‍යා පතල් කාර්යංශය<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>පුපුරණ ද්‍රව්‍ය පාලක |



විමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සඳහා ඉඩදීම සුදුසු බව නිර්දේශ කර ඇති බව දැනුම් දෙන ලදී. | | |
| 17.6 | බැහැරකරන ලද ප්ලාස්ටික් එකතුකර එමගින් පවුඩර් වර්ගයක් නිෂ්පාදනය කිරීම. | අම්බලන්තොට බෝලාන පල්ලිය අසල ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් තිදෙනෙකු විසින් බැහැරකරන ලද ප්ලාස්ටික් එකතුකර එමගින් පවුඩර් වර්ගයක් නිෂ්පාදනය කරන බවත් එකී නිෂ්පාදන කාර්යයයේදී මුක්තවන වායුව මගින් සිදුවන පරිසර දූෂණය අවම කිරීම සඳහා ජනශූන්‍ය ප්‍රදේශයක ස්ථාපිත කිරීම යෝග්‍ය බැවින් ඒ සඳහා සුදුසු ඉඩමක් එකී ව්‍යාපාරිකයන් ඉල්ලුම් කරන බවටත් කරුණු ඉදිරිපත් විය. | අවශ්‍ය බිම් ප්‍රමාණයද ඇතුලත්ව මෙම කර්මාන්තය සම්බන්ධව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශිය ලේකම්, අම්බලන්තොට |

යෝජිත මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා අදාල සියළුම නිලධාරීන්ගේ පැමිණීම අනිවාර්ය බවත් අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 2.15 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 ජූලි මස ....01.................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.



CamScanner